# Abstract No 70

## අභිඥාන ශාකුන්තලයේ ප්‍රේමණීය ජවනිකා

**එල්. පී.විස්නා ලක්මාලි**
සිංහල විශේෂවේදී(තෙවනවසර), සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය
visnalakmali231@gmail.com

සංස්කෘත නාට්‍ය සාහිත්‍යයේ ශ්‍රේෂ්ඨතම නාට්‍ය වන්නේ අභිඥානශාකුන්තලය යි. මෙය බොහෝ විද්වතුන්ගේ සම්භාවනාවට පත් වූ නාට්‍ය කෘතියකි. මහාකවි කාලිදාසයන් මෙම කෘතිය රචනයේ දී දැක් වූ කුසලතාව බොහෝ විද්වතුන්ගේ සම්භාවනාවට හේතු වූ බව දැකගත හැකි ය. දුෂ්‍යන්ත රජුගේ හා සකුන්තලාගේ ආදර කතාව මෙහි ප්‍රධාන වස්තු විෂය වේ. නමුත් මෙය පුද්ගල මනෝභාවයන් සාර්ථක ලෙස නිරූපණය කරන ලද කෘතියක් ලෙස හඳුනාගත හැකි ය. මෙම පර්යේෂණයේ මූලික අරමුණ වන්නේ මෙකී පුද්ගල මනෝභාවයන් නිරූපණය කරලීමේ දී කාලිදාස කතුවරයා අනුගමනය කළ ක්‍රමෝපායයන් කවරේදැයි විමසා බැලීම යි. මේ සඳහා අනුගමනය කළ ක්‍රමවේදය නම් ද්විතීය මූලාශ්‍රය පාදක කොටගැනීම යි. පුද්ගලයාට සිය ජීවිතය තුළ විවිධාකාර වූ අත්දැකීම්වලට මුහුණ දීමට සිදුවේ. ඒ සඳහා එකිනෙකා මුහුණදෙන ආකාරයේ විවිධත්වයක් පවතී. අභිඥානශාකුන්තලය වූ කලී හුදෙක් ම යොවුන් ප්‍රේමය පිළිබඳ ව ම කියැවෙන කෘතියක් නොවෙන බව පැහැදිලි ය. ඇතැම්විට ගෘහජීවිතයේ නන්වැදෑරුම් අවස්ථාවල හටගන්නා මනෝභාව, හැඟීම්, වේදනා හා මනෝගතීන් තීව්‍රතර ලෙස ඉදිරිපත් කිරීම කතුවරයාගේ අරමුණ වන්නට ඇත. මෙම නාට්‍ය අධ්‍යයනය කිරීමෙන් පෙනීයන්නේ කතුවරයා සිය කෘතිය තුළින් පුද්ගල මනෝභාවයේ අනුවේදනීය අවස්ථා මතුකරලීමට උත්සාහගෙන ඇති බව යි. කෙසේ වුව ද සමස්ත කරුණු සලකා බැලීමෙන් අනතුරුව පෙනීයන්නේ අභිඥානශාකුන්තලය හැරුණුකොට ස්ත්‍රී-පුරුෂ ප්‍රේමයේ අනුවේදනීය අවස්ථා මෙතරම් අපූර්ව ලෙස මතුකරලන වෙනත් නාට්‍යය කෘතියක් සමස්ත භාරතයේ ම නොමැති බව යි.

**ප්‍රමුඛපද-** අභිඥානශාකුන්තලය, යොවුන් ප්‍රේමය, දුෂ්‍යන්ත